කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සිව්වන වසර පරීක්ෂණය

පළමුවන සෙමෙස්තරය - 2019/2020

# SLG 4197 – ශාස්ත්‍රීය ලේඛන මූලධර්ම

(පැ දෙකයි)

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න <u>හතරකට</u> (04) පමණක් පිළිතුරු සපයන්න.

---

## 1 කොටස

1. ‘පර්යේෂණ මාතෘකාවක්’ යනු කුමක්දැයි පැහැදිලි කොට ඔබගේ පර්යේෂණ මාතෘකාව තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගත් කරුණු විස්තර කරන්න.

2. පර්යේෂණ ක්‍රමවේදය (Research methodology) සහ පර්යේෂණ විධික්‍රම (research methods) යනු කවර සංකල්පදැයි පැහැදිලි කොට දත්ත රැස්කිරීම සඳහා ඔබගේ පර්යේෂණයට යොදා ගැනීමට නියමිත විධික්‍රම කවරේදැයි සාකච්ඡා කරන්න.

3. දත්ත රැස් කිරීමේ ක්‍රමයක් ලෙස පුස්තකාල සමීක්ෂණ ක්‍රමය භාවිත කළ හැකි ආකාරය ඔබගේ යෝජිත අධ්‍යයනය ඇසුරින් සනිදර්ශනාත්මකව පැහැදිලි කරන්න.

4. “ කිසියම් පර්යේෂණ ක්ෂේත්‍රයක පවතින දැනුම විචාරාත්මක ඇගයීමකට ලක් කිරීම සාහිත්‍ය විමර්ශනයක් ( Literature Review) මගින් සිදු වෙයි”. ඔබගේ යෝජිත අධ්‍යයනය ඇසුරින් විමසන්න.

## 2 කොටස

5. ශාස්ත්‍රීය ලේඛනයක දැකිය හැකි මූලික ලක්ෂණ කවරේදැයි පැහැදිලි කරන්න.

6. “ශාස්ත්‍රීය නිබන්ධයක ව්‍යුහය හා අන්තර්ගතය සැලසුම් කිරීමට අදාළව ගත යුතු තීරණ රැසක් පරිච්ඡේද සංවිධානයට අයත් වේ”. ඔබගේ යෝජිත අධ්‍යයනයේ දළ පරිච්ඡේද සැලැස්මක් ඇසුරින් මේ අදහස සාකච්ඡා කරන්න.

7. ශාස්ත්‍රීය ලේඛනයක උද්ධෘත භාවිත කළ යුතු අවස්ථා කවරේදැයි පැහැදිලි කරන්න.

8. අධෝ ලිපි හෙවත් පිටු අග සටහන් ක්‍රමය ( Footnotes ) සහ කර්තෘ - වර්ෂ ක්‍රමය (Author – Date) අතර පවත්නා වෙනස්කම් සනිදර්ශනාත්මකව දක්වන්න.

***